

# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි

උත්තරාර්ධ ගෝලයේ තිබෙන්නා වූ භූමි ප්‍රමාණය සමතුලිත කරන්නට හැකි මහ දෙරණක් දක්ෂිණාර්ධ ගෝලයේ ද තිබිය යුතුය යන උපකල්පනය අනුව යමින් තමන් ඇසින් නොදුටු මේ අප වසන ඔස්ට්‍රේලියාව එදා යුරෝපීය යෝ "ටෙරා ඔස්ට්‍රාලිස්" හෙවත් දක්ෂිණ භූමිය යන්න නම් ලෙස කලහ. හෙල කවි බසින් මා එය " දකුණු කුරු දිව" ලෙස හඳුන්වමි.

ශ්‍රී ලඬකාද්වීපයේ පසල් දනව්වල සිට මෙකී දකුණු කුරු දිවයින ට සංක්‍රමණය කළ සිංහල පිරිස් බොහෝ ය. මොවුනතුරෙන්, දකුණු කුරු දිවෙහි පූර්ව දිශාවෙහි පිහිටි නව දකුණු වේල්ස ප්‍රාන්තය තම අභිනව වාස භූමිය ලෙස තෝරා ගත්තාවූ ද, තම සිංහල භාෂාව සහ සංස්කෘතිය මේ නව බහු සංස්කෘතික සමාජය තුල ස්ථාපනය කර ඉදිරි පරපුර සඳහා ද සුරක්ෂිත කල යුතු යැයි අධිෂ්ඨාන පූර්වකව ප්‍රාර්ථනා කලා වූ ද, පිරිසක් එකතුව අදින් දශක දෙකකට පෙරාතුව "සිංහල සංස්කෘතික හමුව" නමින් ප්‍රජා සංවිධානයක් පිහිටුවා ලූ හ.

එද මෙදතුර, මෙකී සිංහල සංස්කෘතික හමුව විසින් ඉෂ්ඨ කරන්නට යෙදුනා වූ සද්කාර්යයෝ රාශියෙකි. මේ දේශයේ වාසය කරමින් සිංහල සංගීත, නර්තන, රංගන යනාදී කලා කටයුතු වල නිරතවන්නන් ගේ ද, එවැනි කලාවන් රසවිඳින්නන් ගේ ද යහපත පිණිස නිතිපතා කලා මහෝත්සව සංවිධානය කිරීම ද, ඉදිරි පරපුරට අපේ සිංහල භාෂාව හා සිංහල සංස්කෘතිය උරුමය දයාද කර දීමට සිංහල භාෂා පාසල් පිහිටුවා පවත්වාගෙන යාම ද, මේ දකුණු කුරු දිවයින තුල සිංහල ලේඛන කලාවේ උන්නතාභිවෘද්ධිය සඳහා සිංහල නමින් ත්‍රෛමාසික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම ද මේ අතර වේ.

මේ කටයුතු තවත් ඉදිරියට රැගෙන යමින්, ලේඛන කලාවේ යෙදෙන දකුණු කුරු දිව් වාසී සිංහලයින් විසින් තම සංක්‍රමණික අත්දැකීම් අළලා ප්‍රබන්ධිත කෙටිකතා අඩංගු "තිරස තරණ" නම් වූ පුස්තකයක් ද පසුගිය ද එළි දක්වන්නට යෙදුණි. ශ්‍රී ලංකාව කේන්ද්‍රස්ථානය කොට ගත් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ එක් වැදගත් අංගයක් වන විගාමික සිංහල සාහිත්‍යයෙහි පෝෂණය සඳහා මෙවැනි ප්‍රකාශණයන් හි ඇති වැදගත්කම මෙහිදී විශිෂ්ඨ ලෙසින් දෘශ්‍යමාන විය.

සිංහල පද්‍ය සාහිත්‍යයට ද යම් කිසි ආකාරයකින් විගාමික සිංහලයින් ගෙන් සම්මාදමක් කල යුතුය යන සංකල්පය ඇති වූයේ ඉන් අනතුරුව ය. "දකුණු කුරු දිව් කවි" නමින් මේ සැප්තැම්බරයේ එළි දක්වන්න ට නියමිතව ඇති කාව්‍ය සංග්‍රහය ඒ සංකල්පයේ ප්‍රථිඵලයයි.

මෙම කෘතිය සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීමෙහි ලා හේතු සාධක වූ මුඛ්‍ය අරමුණු කිහිපයකි. පෙරකී ලෙසින් පොදුවේ සිංහල පද්‍ය සාහිත්‍යයට සහ සුවිශේෂීව විගාමික සිංහල සාහිත්‍යයට අනන්‍ය වූ සම්මාදමක් කිරීම, ශ්‍රී ලාංකික සිංහල පාඨකයින් ට ඕස්ට්‍රේලියාව පිළිබඳ පද්‍යයෙන් හැඳින්වීමක් ලබාදීම, දකුණු කුරු දිව් වාසී සිංහල කවි කිවිඳියන් ට තම නිර්මාණාත්මක හැකියාවන් පොදු රසාස්වාදනයට නැංවීමට ඉඩකඩ ලබා දීම ඒ අතර වෙයි.

"දකුණු කුරු දිව් කවි" කාව්‍ය සංග්‍රහය සැකසී ඇත්තේ සිංහල මහා කාව්‍ය සම්ප්‍රදයේ ලක්ෂණ උපයෝගී කොට ගනිමිනි. එසේ නමුදු මේ කෘතිය මුළුමනින් ම ශ්‍රී ලංකාවෙන් පිටස්තර පරිසරයක් විස්තර කරන්නක් වේ. ඒ සමගම, මේ සඳහා කාව්‍යමය දයකත්වය සැපයුනේ එක් කවියෙකු ගෙන් නොව කවි කිවිඳියන් විශාල පිරිසකගෙනි. මේ ඒ ආකාරයෙන් බලන විට මේ දකුණු කුරු දිව් කාව්‍ය සංග්‍රහය වනාහී මින් පෙර සිංහල සාහිත්‍යයේ නොතිබුණු ආකාරයේ අසම-සම කෘතියක් යයි අපි සිතමු.

"පෙදෙ හි රස හව් විඳිනා දෙනෙතා ඉතා දුලබෝ" යයි කවි සිළුමිණ ලිවූ තෙවන පරාක්‍රමබාහු රජු පැවසීය. මේ "දකුණු කුරු දිව් කවි" කෘතිය ප්‍රකාශනයෙහි ලා අපේ අවසාන අරමුණ වන්නේ එවන් දෙනෙත් වඩාත් සුලබ කිරීමය.

අද සිනුවර හසුන අවසාන කරන්නට "දකුණු කුරු දිව් කවි" කෘතියේ ආරම්භක පරිච්ඡේදයේ එන රසික සූරියආරච්චි ලියූ පහත කවි කිහිපය තෝරා ගත්තෙමි.

දකුණු කෙළවරේ ලෝ කුස යටි පැත් තේ
බැඳුනු සයුරු ඉන්දිය පැසිපික් ඇත් තේ
"දකුණු කුරු දිව" ය යන කවි පද මත් තේ
වොරැඳි රට එහි ය සුදණෙනි දත යුත් තේ

වසර හැට දහස් ගණනක් මෙරට තුල
ඇබොරජිනි නමින් හඳුනන මිනිස් කැල
දඩයම් කර කමින් බුදිමින් වනෙහි පල
විසුවෝ පොලෝ තලයට නොම කර අපල

යුරෝපියෝ මේ දිවයින කොහිද සොයා
රුවල් නැවින් මහ සමුදුරු හඹා ගියා
නැව්පති කුක් පැමිණ සැකහැර පිහිටි නියා
මහ රැජිනට එපුවත සැලකර සිටියා

බ්‍රිතානියෙ රජය දික් විජයට කැමැති
සිරකරුවන් රැසක් දඬුවම ලෙස බලැති
දකුණු කුරු දිවට පිටුවාහල් කරති
අණ ඉටු කලෝ ආතර් පිලිප් නැව්පති

එලෙස පැමිණි සුදු ජන බල නිල දරුවෝ
මෙරට හිමි ඇබොරිජිනි වැසියන් මැරුවෝ
පැහැර ගෙන ඉඩම් ජනපද ඇති කෙරුවෝ
දකුණු කුරු දිවෙහි ඔසි දේශය හැදුවෝ

ඇවිත් මෙදෙස දිවි මග සකසන සරණ
කලක් සුදු හමට පමණකි ලැබුනෙ තැන
වෙනස් කලහ පසු කල ඒ අනිසි අණ
පිරිස් බොහෝ එති මෙහි ලොව දස අතින

දෙරණ සිරි ලකේ ඉපිදී දැඩිව යස
පැමිණ දකුණු කුරු දිවයින වෙත එලෙස
වසන මෙරට හෙල දූ පුත් මහ පිරිස
පොරණ සිහල සිරිතට කරති ගරු පස

රකිණු පිණිස සිංහල උරුමය මෙ රට
සැදුණු හමුව සාහිත නව නළු රසට
කෙරුණු සැලසුමකි කවි රස අගැයුමට
බැඳුණු පොත මෙය ය වනමින් ඔසී රට

ලබන මාසයේ නැවත හමුවෙමු.

සිනුවර ආරච්චිල

<sinuwara.arachchila@gmail.com>




Victoria Mercantile
LAWYERS

- Advice On Legal Matters
- Motor Vehicle Disputes/Claims
- Debt Recovery & Enforcement

Anne Heenatimulla LLM (Monash)
Barrister & Solicitor
Attorney-at-Law (Sri Lanka)

Phone: (03) 8787 8590
Mobile: 0401 684 689
Email: VMLawyers@y7mail.com
Address: 10 Yellowbox Crescent, Lyndhurst VIC 3975

